කවරයේ කතාව

# ගැසට් පත්‍රයේ වසර 200 කතාව

නුවරඑළියේ හේමපාල



A Facsimile of the First Number of

THE CEYLON GOVERNMENT GAZETTE.

No 1 MONDAY March 15th 1802

GOVERNMENT ADVERTISEMENT

Printed by FRANS DE BRUIN, at the Government Press.

ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ ෆ්‍රෙඩ්රික් නෝර්ත්ගේ (1798-1805) මෙහෙයවීමෙන් ආණ්ඩුවේ මුද්‍රණාලය මගින් නිකුත් කළ ප්‍රථම නිලවාරිකා ප්‍රකාශනය වූයේ ලංකාවේ ගැසට් පත්‍රයයි. බ්‍රිතාන්‍යයන්ගෙන් ලද ඒ දායාදය ශ්‍රී ලංකාණ්ඩුව මගින් මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන එනු ලැබේ. එය මේ රටේ ජනසන්නිවේදන මාධ්‍යයන්ට අයත් ඉපැරණිතම වාරික ප්‍රකාශනය වේ.

මෙහි ප්‍රථම කලාපය 1802 මාර්තු 15 වෙනි දින නිකුත් වී ඇත. ෆ්‍රාන්ස් ද බ්රුයින් එහි මුද්‍රණ ශිල්පියා වූයේ ය. සතිපතා ආණ්ඩුවේ මුද්‍රණාලය මගින් නිකුත් කළ එය මුලදී නති කොළයේ පිටු දෙකකට සීමා වී පැවැතිණි. එදා එය සැපයීම සඳහා මසකට අය කළ මුදල රික්ස් ඩොලර් 2 කි.

ලංකාණ්ඩුව භාර යටත් විජිත මහ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ පළ කරන ලද මෙහි රජයේ සාමාන්‍ය දැන්වීම්, අධිකරණ නිවේදධන, ප්‍රසිද්ධ වෙන්දේසි, තාවක ගමනා ගමන විස්තර හා ඇතැම් දේශීය හා විදේශීය රාජ්‍ය පුවත් හා මෙහි සේවයේ නියුතු වූ රාජ්‍ය හා හමුද නිලධාරීන් පිළිබඳ නිල පුවත් මෙන්ම පුද්ගලික ආරංචි හා සාහිත්‍ය රචනා ද පළ කොට තිබේ. තවද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු වාර්තා හා යටත් විජිත යුද තොරතුරු විස්තර ආදිය විදෙස් ප්‍රකාශන වලින් උපුටා දැක්වීමට ද උත්සාහ දරා ඇත. එහෙත් කන්ද උඩරට රාජ්‍යය පිළිබඳ පුවත් පළවන්නට වූයේ 1814 දී ඇති වූ යුද්ධප්‍රායාත වලින් පසුව ය. එම අවදියේ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සංස්කාරකවරයා වූයේ ජෝර්ජ් බිසුට් ය. ඔහු ලංකාණ්ඩුකාර ශ්‍රීමත් රොබට් බ්‍රවුන් රිග් ගේ මස්සිනා වූ හෙයින් කන්ද උඩරට යුද්ධ ප්‍රායාත හා ආක්‍රමණික පුවත් කිසිදු පැකිලීමකින් තොරව ලබා ගෙන ගැසට් පත්‍රයේ පළ කිරීමට උනන්දු වී ඇති බව මැනවින් පෙනේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය එහි පරමාර්ථය ප්‍රකාර රජයේ දැන්වීම් හා නිවේදනවලට පමණක් සීමා නොකර ඊට අයත් අතිරේකයක් වශයෙන් පවත්වාගෙන ගිය විවිධ තොරතුරු හා පුවත් අඩංගු කොටස නිසා එය ප්‍රවෘත්ති පත්‍රයක ස්වරූපය ගත්තේ ය. එහෙයින් ඇතැම් දෙනා මෙය ප්‍රවෘත්ති පත්‍රයක් ලෙස සැලකූහ. ගැසට් පත්‍රය එසේ සම්ප්‍රදාය විරෝධී ලෙස පළ කිරීම ගැන උරණ වූ නිල පක්ෂය 1832 සිට එම අතිරේක කොටස බැහැර කළ යුතු බවට උපදෙස් දුන්හ.

එහි ප්‍රතිඵලය වූයේ රාජ්‍ය බලධරයා වූ ලංකාණ්ඩුකාර ශ්‍රීමත් විල්මට් හෝර්ටන්ගේ මෙහෙයවීමෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලය පිහිටි කොට ගෙන ලංකාවේ ප්‍රථම පොදු පුවත්පත බිහිවීමයි. 1832 දී එසේ උපන ලද 'කලම්බු ජනරල්' නමැති ලංකාවේ ප්‍රථම පුවත්පත එංගලන්තයෙන් ලැබුණු නියෝග අනුව 1833 දී අත්හිටුවන ලදී. නමුත් ආණ්ඩුවේ ගැසට් පත්‍රය සිරිත් ප්‍රකාර ආණ්ඩුවේ බලය හා අනුග්‍රහය ලබා ප්‍රසිද්ධ නිල නිවේදනවලට පමණක් සීමා කෙරෙමින් නොකඩවා පළ කැරෙන්නට විය. මුල සිට නිතිකර ඉංග්‍රීසියෙන් පමණක් මුද්‍රිත වූ එහි ප්‍රථම වරට සිංහල නිවේදනයක් පළ වී ඇත්තේ 1814 ජනවාරි 12 වාති දින මුතු කිමිදීම පිළිබඳව ය. නමුත් දෙමළ භාෂාවෙන් වූ නිල නිවේදන පළ කිරීම 1806 සිට වරින්වර සිදු වී තිබේ. යටත් විජිත සමයෙන් පසු නිදහස් ලංකා රාජ්‍යයේ නිල නිවේදන වාරිකය ලෙස නොවෙනස්ව පවත්වාගෙන ආ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය නිකුත් කරන දිනය සඳුද වෙනුවට සිකුරාද දිනයට මාරු වුවද වර්ෂ 1802 සිට 1972 දක්වාම අනුක්‍රමිකව එකම අංක ක්‍රමයකට පවත්වාගෙන එනු ලැබූහ.

1972 මැයි 22 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය බිහිවීමෙන් පසු එහි අංක යෙදීම යළි මුල සිට අරඹන ලදී. 1978 සැප්තැම්බර් 9 වාති දින පූර්ණ බලැති විධායක ජනාධිපති ධූරය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් අනතුරුව එය යළිදු මුල සිට අංක යෙදීමට භාජනය කර ඇත.

මුළුමහත් ශ්‍රී ලංකා ජනරජයේ පූර්ණ බලැති නිල නිවේදන වාරික ප්‍රකාශනය වන ගැසට් පත්‍රය කෙමෙන් අදාළ විෂයය ක්ෂේත්‍රය තුළ පුළුල් වීමෙන් හා විවිධත්වයට පත්වීමෙන් එය දැනට ප්‍රධාන කොටස් 6 කින් සමන්විත දැවැන්ත ප්‍රකාශනයක් බවට පත්වී තිබේ. ඊට අදාළ විවිධ කොටස් සකස් වී ඇත්තේ මෙලෙසිනි.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 1 වෙනි කොටස අනුච්ඡේද 3 කින් සමන්විත වේ. ඒ මෙසේ ය.

1 වෙනි කොටස - 1 ඡේදය (සාමාන්‍ය) ජනාධිපතිතුමා විසින් කරනු ලබන පත්වීම් රජයේ නිවේදන, විවිධ කොමිෂන් සභා මගින් කරනු ලබන පත්වීම් රජයේ නිවේදන, විවිධ කොමිෂන් සභා මගින් කරනු ලබන සාක්ෂි කැඳවීම්, ව්‍යවස්ථා සංශෝධන හා විවිධ දෙපාර්තමේන්තුවල දැන්වීම් මෙයට අඩංගු වේ.

1 වෙනි කොටස IIඅ. ඡේදය - රජයේ තනතුරුවලට අදාළ පොදු කොන්දේසි තනතුරු ඇබෑර්තු, රජය මගින් විවිධ වෘත්තීන් සඳහා පවත්වනු ලබන විභාග හා විභාග ප්‍රතිඵල මෙම ඡේදයට අයත් වේ.

iවෙනි කොටස - IIආ ඡේදය - ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි හා රජයේ තොවන දැන්වීම් ඇතුළත් වනුයේ මෙම කොටසෙහි ය.

iiවෙනි කොටස - අධිකරණ- රජයේ ආඥා හා නියෝග පිළිබඳ නිවේදන, නඩුතීන්දු, අධිකරණ කටයුතුවලට අදාළ නිවේදන මෙහි අඩංගු වෙයි.

iii වෙනි කොටස - ඉඩම්- ඉඩම් රජයට අත්කර ගැනීම්, රජය මගින් ඉඩම් බෙදදීම් හා විකිණීම් පිළිබඳ තොරතුරු පලාත් යටතේ මෙහි පළ වේ. ඉඩම් තීරවුල් කිරීම් ද මෙයට ඇතුළත් වෙයි.

iv වෙනි කොටස කොටස් 2 කින් යුතුව පළ වේ. ඒ මෙසේ ය.

iv(අ) පලාත් සභා - ආණ්ඩුකාර ප්‍රකාශ, පත් කිරීම්, පලාත් සභා නිවේදන විවිධ දැන්වීම්, තනතුරු ඇබෑර්තු, විභාග ප්‍රතිඵල - කොන්දේසි ටෙන්ඩර්, විවිධ දැන්වීම්.

iv(ආ) පලාත් පාලනය - තනතුරු ඇබෑර්තු - විභාග ප්‍රතිඵල - පලාත් පාලන නිවේදන - අතුරු ව්‍යවස්ථා - පලාත්පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් - ආදායම් හා වියදම් ප්‍රකාශන අයවැය ලේඛන - දේපල විකිණීම් විවිධ දැන්වීම්

V වෙනි කොටස - පොත් නාමාවලිය- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර රෙජිස්ට්‍රාර්වරයා වෙත ලංකාණ්ඩුවේ ආඥා පණත් 179 යටතේ ලියා පදිංචියට ලැබී ඇති පොත්පත් සඟරා පිළිබඳ නාමාවලියක් වන මෙය ත්‍රෛමාසිකව පළ කෙරේ.

මෙහි පොතේ නම, කර්තෘ, විෂයය, මුද්‍රිත ස්ථානය, ප්‍රකාශිත ස්ථානය, මුද්‍රණාලයේ නම, ප්‍රකාශකයේ නම, නිකුත් කළ දිනය, පිටු ගණන, ප්‍රමාණය, පිටපත් ගණන, සංස්කරණය හා ප්‍රකාශන හිමිකරු යනාදිය සඳහන් වේ.

Vi වෙනි කොටස - වාර්ෂිකව පළකරනු ලබන මෙම කොටසට අයත් වනුයේ රජයේ වෛද්‍යවරුන්, ජූරි සභිකයින් හා විවාහ උප්පැන්න හා මරණ ලේකම්වරුන්ගේ නාමාවලියකි.

ශ්‍රී ලංකා ගැසට් පත්‍රය පළවීම සාමාන්‍ය ලෙසයෙන් නොකඩවා සතිපතා සිදුවෙතත් උද්ගතවන හදිසි අත්‍යවශ්‍යතාවත් අනුව නියෝග හා නිවේදන අති විශේෂ ගැසට් පත්‍ර මගින් සිදු කරනු ලැබේ.

හරියට රාත්‍රී 12 කණිසමට නිකුත් කිරීමට නියමිත මෙම අතිවිශේෂ අතිරේක ගැසට් මහජනයා කුතුහලයට මෙන්ම භීතියට ද පත් කරවන අවස්ථා ද නැත්තේ නොවේ. ❑